**English version of letter sent in Sinhala**

Via e-mail
chairman@elections.gov.lk

04 January, 2018

**Chairman,**
**Sri Lanka Election Commission**
Election Secretariat
Sarana Mawatha
Rajagiriya.

**Violation of election laws by HE the President**

Exactly a week ago on 28 December, 2017 a written complaint was made to you by me on the above issue that was about the launch of the UPFA election manifesto for the LG election ñing the Presidential Secretariat. In that complaint I requested the Election Commission to take appropriate action and make them public too,

1. against using the Presidential Secretariat for election propaganda
2. to investigate the source of funding the total event including the rent for using the BMICH
3. against using the State owned SL Rupavahini for promoting this event.

But, you maintain stoik silent on the complaint made against the President violating election laws and continue to make public statements that use of State resources and assets violate election laws and hold Public Servants responsible for such violations. You have also made e-mail accounts public for complaints to be made on a district basis. All such publicity stunts end up as jokes in the face of inaction on the complaint I have lodged with you.

You have left space for more violations by delaying action against complaints on election law violations. You and the Election Commission is not paid for by Taxpayers' money for such inaction. I also accuse you of politically compromising the independence and the responsibility of the Commission by not taking any action on the complaint I made against HE the President.

You still have time to clear the Election Commission of this accusation. I therefore request you to immediately take action on the complaint I made on 28 December, 2017 regarding HE the President violating election laws.

Thank you.
Yours sincerely,

**Kusal Perera**
Independent journalist

Cc. All media

විද්‍යුත් තැපැල මගින්
chairman@elections.gov.lk

2018 ජනවාරි 04 වන දින

**සභාපති,**
**ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව**
මැතිවරණ මහ ලේකම් කාර්යාලය
සරණ මාවත
රාජගිරිය.

සභාපතිතුමනි,

**ජනාධිපති විසින් මැතිවරණ නීති උල්ලංඝණය කිරීම**

මීට හරියටම සතියකට පෙර 2017 දෙසැම්බර 28 වන දින උක්ත කාරණාවට අදාල වූ පළාත් පාලන මැකිවරණය වෙනුවෙන් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මැතිවරණ ප්‍රකාශනය ජනාධිපති ලේකම් කාර්යාලය යොදා ගනිමින් එළි දැක්වීම සම්බන්ධයෙන් මම මෙවැනිම ලිඛිත පැමිණිල්ලක් ඔබ වෙත යොමු කළෙමි. එමගින් මම,
1. ජනාධිපති ලේකම් කාර්යාලය මැතිවරණ කටයුතු වෙනුවෙන් යොදා ගැනීම
2. බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා ගාස්තුව සහ එම උත්සවය වෙනුවෙන් සිදු කළ වියදම් පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වීම
3. ජාතික රූපවාහිනිය එම මැතිවරණ ප්‍රචාරක කාර්ය සඳහා යොදා ගැනීම
යන කාරණා සම්බන්ධයෙන් මැතිවරණ කොමිසම වහා පියවර ගත යුතු යැයිද ඒ පියවර ප්‍රසිද්ධ කළ යුතුයැයිද ඉල්ලා සිටියෙමි.

එහෙත් ජනාධිපති විසින් මැතිවරණ නීති උල්ලංඝණය කළේ යැයි මා කළ පැමිණිල්ල සම්බන්ධයෙන් නිහඬ වන්නා වූ ඔබ, මැතිවරණ කටයුතු සඳහා රාජ්‍ය දේපළ හා සම්පත් භාවිතය නීති විරෝධි යැයි හා එවැනි කාර්යන් සඳහා රජයේ නිලධාරීන් වගකිව යුතු බව නැවත නැවතත් මාධ්‍යයට ප්‍රකාශ කිරීමත් පැමිණිලි සඳහා විද්‍යුත් තැපැල් ගිණුම් දිස්ත්‍රික්ක අනුව ප්‍රකාශයට පත් කිරීමත් විහිළුවක් යැයි මම කියමි.

මැතිවරණ නීති උල්ලංඝණය පිළිබඳව කෙරෙන පැමිණිලි සම්බන්ධයෙන් පියවර ගැනීමේදී කල් මැරීමෙන්, එවැනි උල්ලංඝණ කිරීම් සඳහා ඔබ විසින් තව දුරටත් ඉඩ තබන්නේය. ජනතා බදු මුදලින් ඔබ ඇතුළු මැතිවරණ කොමිසම නඩත්තු කෙරෙන්නේ ඒ සඳහා නොවේ. එපමණක්ම නොවේ. ජනාධිපතිට එරෙහි එම පැමිණිල්ල සම්බන්ධ කිසිදු පියවරක් නොගැනීමෙන් ඔබ මැතිවරණ කොමිසමේ ස්වාධීනත්වය හා වගකීම දේශපාලන වශයෙන් පාවා දෙන්නේ යැයිද මම චෝදනා කරමි.

මෙම චෝදනාවෙන් මැතිවරණ කොමිසම නිදොස් කරගැනීමට ඔබට තවමත් කාලය ඇත. එබැවින් ඒ වෙනුවෙන් මවිසින් 2017 දෙසැම්බර 28 වන දින ජනාධිපති විසින් මැතිවරණ නීති උල්ලංඝණය කළ බවට යොමු කළ පැමිණිල්ලට අදාලව වහා පියවර ගන්නා මෙන් නැවත මෙයින් ඉල්ලමි.

ස්තූතියි.
මෙයට විශ්වාසි,

**කුසල් පෙරේරා**
ස්වාධීන මාධ්‍යවේදී

පිටපත් - සියලු මාධ්‍ය වෙත